III වන කොටස - දෙවියන්වහන්සේට දෙන වේලාව

නමස්කාරය සහ යාච්ඤාව තුළ දෙවියන් වහන්සේගේ ශුද්ධ අභිමුඛත්වයෙහි ගතකරන වේලාව

දෙවියන් වහන්සේගේ යුද්ධායුධවලින් සැරසීම

(මේ යාච්ඤාව ඔබගේ දිනපතා උදෑසන දින චර්යාවේ කොටසක් කරගන්න. සෑම දිනකම නැඟී එන ආත්මික අභියෝගවලට දෙවියන් වහන්සේගේ ශක්තියෙන් සහ බලයෙන් මුහුණදීමට මේ යාච්ඤාව ඔබව සූදානම් කරනු ඇත.)

ප්‍රේමණීය ස්වාමීන්වහන්ස මම මගේ නිදියහනින් නැගිටින විටම, මම පා තබන්නේ යුද්ධ භූමියකට බව මම දනිමි. එනමුත් මම තවත් දෙයක් දනිමි. එනම්, ස්ථිරව නැගීසිටීමට අවශ්‍ය සියල්ලම ඔබවහන්සේ මට දී ඇති බවය. එහෙයින් ඔබවහන්සේ ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් මම දෙවියන් වහන්සේගේ යුද්ධ යුධ වලින් සැරසෙන්නෙමි.

පළමුව, මගේ හිස මත ගැලවීමේ ආරක්ෂා තොප්පිය දමාගන්නෙමි. කරුණාවෙන් මාගේ මසන සහ මාගේ සිතුවිලි ආරක්ෂා කරගත මැනව. මාගේ ඇස් දෙක රැකගත මැනව. කිසිම පාපයකට ඇතුල්වීමට ඉඩ නොහැරිය මැනව දෙවියන් වහන්සේගේ දේ වෙත මාගේ සිතුවිලි සියල්ල යොමුකල මැනව. ධර්මිෂ්ඨකම නමැති ළයවැස්ම මඟින් මාගේ හදවත සහ සියලු හැඟීම් ආරක්ෂාකරනු ලැබේවා. මාව පාලනය කරනු ලබන්නේ මාගේ හැඟීම් මඟින් නොව නමුත් සත්‍යයන් වන ලෙසට මම යාච්ඤාකරමි. ඉන පටියක් ලෙසින් ඔබවහන්සේගේ සත්‍යය වටා ඔතා ගන්නෙමි. සියලූ වැරදිවලින් කරුණාවෙන් මා රැකගත මැනව. මාගේ පාද ආරක්ෂාකිරීමට මම සමාදානයේ පාවහන් පැළඳගනිමින් ඔබගේ සත්‍යම තුළ මාගේ පාද සවිකළ මැනව. සියලූ පහරදීම් ඉදිරියේ ස්ථිරව සිටගැනීමට මා බලසම්පන්න කළ මැනව.

මීළඟට, ඇදහිල්ල නමැති පලිහ මම අතට ගන්නෙමි. සාතන්ගේ ගිනිමය ඊතලවලින් සමිඳුනි කරුණාවෙන් මා රැකගත මැනව. යක්ෂයාගේ සියලූ උපායන්ට විරුද්ධව නැඟී සිටීමට ඔබවහන්සේගේ හමුදාව සමඟ මාව එකට තැබුව මැනව. අවසාන වශයෙන් ආත්මයාණන්වහන්සේගේ කඩුව එනම් ඔබවහන්සේගේ ශුද්ධ වචනය මම අතට ගනිමි. අලුත්වූ පුබුදුකරන්නාවූ විධිවලින් බයිබලය කියවීමට මට උදව්කරන්න. සමිඳුනි එවිට සැමවිටම සියලූ පහරදීම් ආපස්සට හරවන්නටද ඔබවහන්සේගේ සත්‍යි අන්යේයන්ක්සමඟ බෙදාගැනීමටද මම සූදානම්ව සිටින්නෙමි.

ස්වාමීනි, අද දිනය තුළ මම පහරදීමට මුහුණදෙන බව දනිමි. එනමුත් මට ස්ථිරව සිටගැනීමට ඔබවහන්සේ මා බලගන්වා ඇතිසේක. සමිඳුනි කරුණාවෙන් අද දිනයේ සටනට අවශ්‍යශක්ති යමට දුන මැනව. ස්වාමීන්වහන්සේගේ ප්‍රීතිය මාගේ ශක්තිය වන්නේය. යේසුස් වහන්සේගේ නාමයෙන් යාච්ඤාකරමි. ආමෙන්.

බයිබල් සඳහන (එපීස 6:13-18)

ස්වාමීන්ගේ යාච්ඤාව

ස්වර්ගයෙහි වැඩසිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා. ඔබගේ රාජ්‍යයේවා, ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද කරනු ලැබේවා. අපේ දවස්පතා භෝජනය අපට අද දුන මැනව. අපේ ණයකාරයන්ට අප කමාකළාක් මෙන් අපේ ණයත් අපට කමාකළ මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගැළවුව මැනව. මක්නිසාද රාජ්‍යයත් බලයත් මහිමයත් සදාකාලයටම ඔබවහන්සේගේය.

ආමෙන්

බයිබල් සඳහන (මතෙව් 6:9-13)

ස්වාමීන්වහන්සේගේ ආරක්ෂාව සඳහා යාච්ඤාව

මහෝත්තමයාණන්ගේ රහස් ස්ථානයේ වාසයකරන අපි, සියලු බලැතියාණන්ගේ සෙවණැල්ල යටතෙහි වාසය කරන්නමු. "උන්වහන්සේ මාගේ ආරක්ෂා ස්ථානයය. මාගේ බලකොටුවය, මාගේ දෙවියන් වහන්සේ ඔබවහන්සේ කෙරෙහි විශ්වාසකරන්නෙමි" යයි මම ස්වාමීන්වහන්සේට කියන්නෙමි.

සත්‍යයෙන්ම ඔබවහන්සේ පක්ෂි වැද්දාගේ උගුලෙන්ද බියකරු ලෙඩරෝගවලින්ද අප රැකගන්නා සේක.

ඔබවහන්සේගේ පියාපත්වලින් ඔබ අප ආවරණය කරනසේක,

තවද ඔබවහන්සේගේ පියාපත් යම අප ආරක්ෂාවන්නෙමුව.

ඔබවහන්සේගේ සත්‍යවාදීකම අපට රැකවරණය සහ පලිහද වන්නේය.

රෑ කාලයේ ඇතිවන බියටවත් දවාලේ විදින ඊගසටවත් අඳුරේ ගමන්කරන වසංගතයටවත් ඉරමුදුන් වේලාවේ පාළුකරන විනාශයටවත් අපි බිය නොවන්නෙමු.

අපගේ පැත්තක දහසක් දෙනාද,

දකුණු පැත්තක දස දහසක් වැටෙන්නට හැකිය. එහෙත් එය අප ලඟට එන්නේ නැත.

එහෙත් එය අප ලඟට එන්නේ නැත.

අපගේ දෙනෙතින් අප එය දකිනවා පමණය,

දුෂ්ටයාගේ විපාකය අප දකිනවා පමණය.

මක්නිසාද ස්වාමීනි අපි ඔබ අපගේ ආරක්ෂා ස්ථානය කරගත්තෙමුව,

මහෝත්මයාණන් අපගේ වාසස්ථානය කරගත්තෙමුව,

අප වෙත කිසි නපුරක් පැමිණෙන්නේ නැත.

අපගේ වාසස්ථානයට කිසිම වසංගතයක් ළඟාවන්නේ නැත,

මක්නිසාද අපගේ සියලු මාර්ගවලදී අප ආරක්ෂාකරන පිණිස, ස්වකීය දේවදූතයන්ට උන්වහන්සේ අප ගැන අණදෙන සේක.

අපගේ පය ගලක නොවදින ලෙස, ඔවුන්ගේ අත් පිට අප උසුලාගන්නවා ඇත.

අප සිංහයෙකු වුවත් සර්පයෙකු වුවත් පාගන්නෙමුව,

තරුණ සිංහයාත් සර්පයාත් පයින් පාගන්නෙමුව.

"මක්නිසාද අපි අපගේ ප්‍රේමය ඔබ වෙත තැබූ නිසා ඔබවහන්සේ අප මුදාහරින සේක. අපි ඔබවහන්සේගේ නාමය දැනසිටින නිසා මාව උසස් කරනසේක.

අපි ඔබවහන්සේට යාච්ඤාකරන්නෙමුව. ඔබවහන්සේ අපට උත්තර දෙන සේක.

දුකේදී ඔබවහන්සේ අප සමඟ වන සේක.

ඔබවහන්සේ අප මුදා ගෞරවයට පමුණුවන සේක,

අපට දීර්ඝායුෂදී ගැළවීම අපට පෙන්වන සේක."

බයිබල් සඳහන (ගීතාවලිය 91)

ස්වාමීන් වහන්සේ අපගේ සැපයුම්කරුවාණෝය (අපගේ සියලු අවශ්‍යතාවන් උන්වහන්සේ සපුරාලන සේක.)

ස්වාමීන්වහන්ස, ඔබ මාගේ එඬේරාණෝය, මට කිසි හිඟයක් නැත. මට අවශ්‍ය සියල්ලම මට තිබෙන්නේය.

නිල්තණ බිම්වල ඔබ  මා ලඟින්ට සලස්වනසේක.

නිසල දිය අසලින් මට මඟපෙන්වන සේක.

ඔබවහන්සේ මාගේ ආත්මය ප්‍රාණවත්කරන සේක. මාගේ ශක්තිය අලුත්කරන සේක.

ඔබවහන්සේගේ නාමය ගෞරවයට පමුණුවමින් මා නිවැරදි මාවතේ ගෙනයනසේක.

එසේය, ඉතාම අඳුරු මිටියාවත මැදින් මම ගමන්කරන විටදී පවා මම බිය නොවන්නෙමි.

මන්ද මාගේ ස්වාමීන්වහන්ස ඔබවහන්සේ මා සමඟය,

ඔබවහන්සේගේ දණ්ඩෙන් සහ සැරයටියෙන් මට ආරක්ෂාවද සැනසිල්ලද ලැබේ.

මාගේ සතුරන් ඉදිරියෙහිදී ඔබවහන්සේ මට

මංගල බොදුනක් පිළියෙල කර දෙන සේක.

මාගේ හිස තෙලින් ආලේපකරන සේක,

ආශිර්වාද වලින් මාගේ කුසලාන උතුරා යයි.

සැබවින්ම ඔබවහන්සේගේ යහපත්කමත් නොනවතින ප්‍රේමයත්

මාගේ සියලු දවස්වල මා අනුව එන්නේය.

තවද, ස්වාමීන්වහන්ස මම සදාකල්ම ඔබවහන්සේගේ නිවසෙහි ජීවත්වන්නෙමි.

බයිබල් සඳහන (ගීතාවලිය 23)

තුන්වන පැයේ යාච්ඤාව

යේසුස් වහන්ස ඔබවහන්සේ මරණයට පත්වුසේක, එනමුත් ආත්ම උදෙසා ජීවනයේ උල්පත පැන නැගුනේ තවද දයාවේ මහා සාගරය මුළු ලෝකයටම විවර වුයේය.

ජීවනයේ උල්පතවූ සමිඳුනි කිසිදා තේරුම්ගත නොහැකි දිව්‍යිමය දයාවන්තයාණෙනි මුළු ලෝකයම වටකරගනිමින් අප මත ඔබවහන්සේව හිස්කළ මැනව.

අප වෙත වූ දයාවේ උල්පතක් ලෙසින්,

යේසුස් වහන්සේගේ හදවතින් ගලාගෙන ආ රුධිරය සහ වතුර වෙත අපි අපගේ විශ්වාසය තබමු.

ශුද්ධ දෙවියන් වහන්සේ, අති ශුද්ධ බලවත්තයාණන් වහන්ස ශුද්ධ සදාකාලික තැනන්වහන්ස අප වෙතද මුළු ලොව වෙතද දයාව දැක්වුව මැනව. (තුන් වරක්)

ස්වාමිවූ යේසුස් වහන්ස, දයාවේ රජ්ජුරුවන්වහන්ස අපි ඔබ තුළ විශ්වාස කරන්නෙමු.

ආමෙන්.

දෙවියන් වහන්සේගේ මඟපෙන්වීම සෙවීම

ස්වාමීනී, මට ගැනීමට අවශ්‍යතීරණ උදෙසා මම ඔබගේ මඟපෙන්වීම සොයන්නෙමි. මගේ ජීවිතය උදෙසාවූ ඔබගේ කැමැත්ත සොයන්නෙමි. ස්වාමීනී මාගේ මුළු හදවතින්ම මම ඔබවහන්සේ විශ්වාස කරන්නෙමි. මම මගේම දැනුම මත නොයැපෙන්නෙමි. මම කරන සියල්ල උදෙසාම ඔබවහන්සේගේ කැමැත්ත සොයන්නෙමි. තවද සමිඳුනි, ඔබවහන්සේ මා ගතයුතු මාවත මට පෙන්වන බව දන්නෙමි.

ස්වාමීනි, ඔබවහන්සේගේ ශුද්ධ පාමුල නිශ්චලව සිටීමට මට උගන්වන්න. ඔබවහන්සේගේ සිහින් හඬ ඇසීමට ඇති හැකියාව මට උගන්වන්න. මම ඔබවහන්සේට කීකරුවෙමින් ඔබගේ අණපනත් පවත්වන ලෙස මට ආශිර්වාද කරන්න.,

පියාණෙනි යේසුස්වහන්සේගේ නාමයෙන් මම යාච්ඤා කරමි ආමෙන් .,

බයිබල් සඳහන (හිතෝපදේශ 3:5-6)

කාංසාව, සිතේ ආතතිය සහ කරදර අභිබවා ජයගැනීම සඳහා යාච්ඤාව

සියලු බලැති දෙවියන්වහන්ස., මම යාච්ඤාවෙන් ඔබ වෙතට එන්නෙමි., මා කෙබඳු දේ දරාගෙන යන්නේදැයි ඔබ වහන්සේ දන්නා සේක., මම කරදරයෙන් සහ සිතේ ආතතියෙන් පිරී සිටිමි., මම කරදරවූවත්., කාංසාවෙන් පිරුනත් එයින් කිසි වැඩක් නැති බව මම දන්නවා ස්වාමීනි., තවද ඔබ වහන්සේ සියලු බලය ඇත්තාවූද බලයෙන් පිරුණාවූ සහ ප්‍රේමණීයවූ දෙවියන්වහන්සේ බවද මම දන්නෙමි., ඔබවහන්සේගේ ආශිර්වාදය සහ සමාදානය සොයාගෙන මම ඔබ වෙත එන්නෙමි., ඔබවහන්සේගේ සියලු දරුවන් ඔබ ඉදිරිපිටට පැමිණීමට ඔබ ආරාධනා කරන බවද මම දන්නෙමි., ඒ අතරට මා වැනි වෙහෙසව., බර උසුලමින් සිටින අයද ඇතුලත් වන බවද දනිමි., ඔබවහන්සේ තුළ මට නිවාඩුව ඔබ පොරොන්දු වී ඇති බව මම දන්නෙමි., මාගේ සියලු කාංසාව සහ සියලු කරදර මම ඔබට දෙන්නෙමි., මන්ද ඔබවහන්සේ මා ගැන සලකනසේක., ස්තුතියි ස්වාමීන්වහන්ස., ඔබවහන්සේ හදවතින් ඉතාම මෘදුය., යටහත් පහත්ය., ඔබවහන්සේ තුළ මට නිවාඩුව හමුවන්නේය.,

මා වාගේම තත්වයන්ට මුහුණ පාන්නාවූ මෙලොව සිටින ඔබගේ සියලු ප්‍රේමණීය දරුවන් මම දැන් යාච්ඤාවෙන් ඔබ වෙත ඔසවන්නෙමි., ඔබවහන්සේගේ සමාදානයෙන් අපට ආශිර්වාද කළ මැනව.,

පියාණනි මම මේ යාච්ඤාව ඉල්ලා සිටින්නේ යේසුස්වහන්සේගේ බලවත් නාමය නිසාය.,

ආමෙන්.,

බයිබල් සඳහන (මතෙව් 11:28-30., 1 පේතෘස් 5:7)

සුවය සඳහා යාච්ඤාව

සියලුබලැති දෙවියන්වහන්ස., ඔබවහන්සේ ශුද්ධය., ධර්මිෂ්ඨය., ඔබවහන්සේ බලවන්තය., එසේද දයාවෙන් පිරී ඇත., ස්වර්ගයේ සහ පොළවේ සියලු අධිකාරීත්වය ඔබවහන්සේගේය.,

ප්‍රේමණීය දෙවිසමිඳුනි., ඔබ කරුණා අනුග්‍රහය දෙවියන්වහන්සේය., අප සියලුදෙනාටම ඔබවහන්සේ ජීවනය දුන්සේක., ඔබ අපගේ ගැළවුම් කරුවාණෝය., ඔබවහන්සේගේ දෑතෙහි සහ ඔබවහන්සේගේ අධිකාරීත්වය තුළ ., රෝගයට සහ කරදරයට ඉහලින් සුවකිරීමේ බලය තිබෙන්නේය.,

ඔබවහන්සේ කෙතරම් ප්‍රේමණීයද., දයාවෙන් පිරී ඇතිද., ඔබවහන්සේගේ එකම පුත්‍රයාණන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අපගේ ගැළවුම්කරුවාණෝ ලෙස අපට දුන්සේක., යේසුස්වහන්සේගේ සුවකිරීමේ කසපහරින් සහ එතුමන්ගේ ශුද්ධ ලේ වලින් අපගේ සියලුම පාප සහ රෝග කුරුසිය මත සෝදාහරිනු ලබන්නේය., අපි සුවය ලැබුවෙමුව! ස්වාමීන්වහන්සේ මාගේ සියලුම දුර්වලකම් සහ පාපයන් ඔබවහන්සේට කියා සිටින්නෙමි:

ස්වාමීනි., මට කමාවුව මැනව., ඔබවහන්සේ නැති වමට කිසිත් නැත., මා සුවය ලබන්නේ ඔබගේ කරුණා අනුග්‍රහයෙන් පමණය., ඔබ සියලු හාස්කමේ දෙවියන්වහන්සේය., ඔබවහන්සේගේ සියලු බලයෙන් පිරී., ප්‍රේමණීය., දයාබර බලය තුළ මම විශ්වාස කරමි., ඔබවහන්සේ මට කමාව දී මා සුවකළ සේක., ස්වාමීනි., මට පවිත්‍රවූත් හදවතක් දීම ගැන මම ස්තුති කරමි., ස්වාමීනි., ඔබවහන්සේගේ සමාදානය දීම ගැන මම ස්තුති කරමි., කරුණාවෙන් මා සමග සදහටම සිටිය මැනව., ඔබවහන්සේ එම්මානුවෙල්ය (දෙවියන්වහන්සේ අප සමගය).,

මාර්ගයද සත්යියද ජීවනයද ඔබවහන්සේය., මාගේ ජීවිතයේ ආලෝකය ඔබවහන්සේය., මා ගැළවීම ලැබුවේ මා වෙතවූ ඔබ ප්‍රේමයෙන්ය., ඔබවහන්සේගේ අනගි., ශුද්ධ ලෙයින් මා වසා තැබුව මැනව.,

ස්වාමීවූ යේසුස්වහන්ස., මාව තවත් ඔබට ලංකරගත මැනව., ඔබගේ මහත් බලය තුළ මම විශ්වාස කරමි., ඔබවහන්සේ මාගේ සුවකරන්නාණෝය., ආරක්ෂකයාණෝය., මාගේ සරණය., ඔබ මාගේ දෙවියන්වහන්සේය.,

ස්වාමීවූ යේසුස්වහන්ස., මාව තවත් ඔබට ළංකරගත මැනව., ඔබගේ මහත් බලය තුල මම විශ්වාස කරමි., ඔබවහන්සේ මාගේ සුවකරන්නාණෝය., ආරක්ෂකයාණෝය., මාගේ සරණය., ඔබ මාගේ දෙවියන්වහන්සේය.,

ස්වාමීවූ යේසුස්වහන්සේ., ඔබ මා ගැන සියලුම දෙය දන්නා සේක., මාගේ අවශ්යිතාවයන් සහ මාගේ ආශාවන් දන්නාසේක., ඔබවහන්සේ බලවත්වූ ශුද්ධවූ දෑතට මම මාව කැපකරන්නෙමි. ඔබවහන්සේගේ කැමැත්ත ලෙස මට සිදුවේවා. මම ඔබවහන්සේගේය. මම ගැළවීම සහ සුවය ලැබීමි.

පියාණෙනි., ඔබගේ කරුණා අනුග්‍රහය සහ ආශිර්වාදය අවශ්යිවන මාගේ සියලුම සහෝදර සහෝදරියන් ගැනද මම යාච්ඤාකරමි. මම මාගේ සියලුම යාච්ඤා ඉල්ලා සිටින්නේ යේසුස්වහන්සේගේ බලවත්වූ නාමය නිසාය. ආමෙන්.

බයිබල් සඳහන (යෙසායා 53:5., ගීතාවලිය 103:1-5., යොහන් 14:6)

දෙවියන්වහන්සේගේ බලයෙන් සහ අධිකාරිත්වයෙන් නරක සිතුවිලි සහ පුරුදු පහකර දැමීම

ආදර සමිඳුනි., ඔබවහන්සේගේ ආශිර්වාදය සහ අනුග්‍රහය මා පිට ඇති බව මම දන්නෙමි. ඔබගේ දෑස ඉදිරියේ නොවටින්නාවූ සිතුවිලි සහ පුරුදු සමග මම පොර බදන්නෙමි. මේ සියලු නරක සිතුවිලි සහ පුරුදු පහකර දැමීමට මට අවශ්‍යය. සර්පයින් සහ ගෝනුස්සන් පයින් පාගා දැමීමට මට බලය සහ අධිකාරීත්වය දීම ගැන මම ස්තුති කරමි. එසේම සතුරාගේ සියලු බලයට ඉහලින් මට බලයදීම ගැන ස්තුති කරමි. තවද කිසිවක් කිසිම ආකාරයකින් මට පහර නොදෙන්නේය. එසේ හෙයින්., මෙම නරක සිතුවිලි හා පුරුදු වලට මේ මොහොතේම මා අතහැර යන ලෙසින්., යේසුස්වහන්සේගේ බලවන්ත නාමයෙන් මම අණකරමි. ස්වාමීනි., ඔබවහන්සේගේ අගනා ලෙයින් මා සෝදා සියලු පාපයෙන් මා පවිත්‍ර කළ මැනව. ඔබගේ කරුණා අනුග්‍රහයෙන් සහ දයාවෙන් මා පිරෙව්ව මැනව., ඔබවහන්සේගේ ශුද්ධවූ නාමය මහිමයට පත්කිරීමට සහ උසස්කිරීම උදෙසා මා ජීවත්වෙම්වා. මා යාච්ඤාකරන්නේ යේසුස්වහන්සේගේ බලවත්වූ නාමය නිසාය. ආමෙන්.

බයිබල් සඳහන (ලූක් 10:19)

සාමය උදෙසා යාච්ඤාව

ස්වාමීන්වහන්ස., මාගේ හදවත කරදරයෙන් පිරී ඇත . මට සමදානය නැත්තේය. මාගේ මනස වෙනතකට හැරවීමට මම උත්සාහ කළද., කරදරයට පත්කරන සිතුවිලි නැගී එන්නේය. ස්වාමිවූ යේසුස්වහන්ස., ඔබගේ සියලු දරුවන්ට ඔබගේ සමාදානය ඔබ වහන්සේ පොරෝනදුවූ සේක. ඔබවහන්සේ මෙසේ පැවසූ සේක. "නුඹලා වෙත සමාදානය තබා යමි. මාගේ සමාදානය නුඹලාට දෙමි. මා දෙන්නේ ලෝකයා දෙන්නාක් මෙන් නොවේ. නුඹලාගේ සිත් කැළඹෙන්නටවත් භයවෙන්නටවත් නොදෙල්ලා."

ස්වාමීවූ යේසුස්වහන්ස., මම ඔබගේ පොරොන්දුව විශ්වාස කරමි. මම ඔබවහන්සේ තුළ විශ්වාස කරමි. මා සමග සිටින නිසා මම ඔබවහන්සේට ස්තුතිකරමි සමිඳුනි. මම ඔබගේ ශුද්ධ නාමයට ප්‍රශංසා කරන්නෙමි. ඔබ මට සලකන බැවින් මාගේ සියලු කරදර මම ඔබ වහන්සේට යටත් කරන්නෙමි. තවද ඔබගේ සමාදානය මා පිට බව මම විශ්වාස කරන්නෙමි. ඔබගේ සමාදානය මා තුළ ක්‍රියාකරන්නේය. ඔබගේ සමාදානය සියලු මනුෂ්‍යරයාගේ තේරුම්ගැනීම අභිබවා යන්නේය. ස්වාමීන්වහන්ස., ස්තුතිවේවා.

ස්වාමීන්වහන්ස., ඔබ කෙරෙහි ස්ථිරලෙස සිතතබා සිටින සියල්ලෝම., ඔබ කෙරෙහි විශ්වාස කරන බැවින් ඔබ ඔවුන් ශාන්ත සමාදානයෙන් ආරක්ෂාකරන සේක. ස්වාමීනි., මම ඔබ විශ්වාස කරමි. ඔබ අපගේ සදාතන පර්වතය සහ අපගේ සදාකාලික ශක්තියය. මම සමාදානයෙන් වැතිර නිදාගන්නෙමි., මන්ද ඔබ පමණක් මා සුරක්ෂිතව තබන සේක.

ඔවුන්ගේ හදවත් තුළ සමාදානය නැති ඔබගේ සියලු දරුවන් උදෙසාද මම යාච්ඤා කරමි., ඔබගේ සමාදානය ඔවුන් හදවත් ස්පර්ශකරමින් ඔවුන්ද සනසනු ලැබේවා. පියාණෙනි මා මේ යාච්ඤාව ඉල්ලා සිටින්නේ යේසුස්වහන්සේගේ බලවත් නාමය නිසාය. ආමෙන්.

බයිබල් සඳහන (යොහන් 14:27., ගිතාවලිය 4:8., යෙසායා 26:3., 1 පේතෘස් 5:7., පිලිප්පි 4:6-7)

තමන්ගේම වැරදි සහ පාපයන් උදෙසා දෙවියන්වහන්සේගේ කමාව ඉල්ලාගැනීම උදෙසා යාච්ඤාව

ප්‍රේමණීය ස්වර්ගීය පියාණෙනි., ඔබවහන්සේගේ ශුද්ධවූ අබිමුවට පැමිණ ඔබ පාමුල හිඳගන්නට මට ඉඩදුන මැනව. මාගේ සිතුවිලිතුලින්ද මාගේ වචන සහ මාගේ ක්‍රියාතුළින් මා විසින් කළාවූ සියලුම පාප උදෙසා මම ඔබගේ කමාව ඉල්ලා සිටින්නෙමි.

((( ඔබ කළාවූ සියලු වැරදි සහ පාප උදෙසා කමාව ඉල්ලා සිටින්න :

ඔබගේ ළමා වියේදී

ඔබගේ තරුණ වයසේදී

ඔබගේ වැඩකරන ස්ථානයේ / පාසැලේ/ කාර්යාලයේදී

ඔබගේ පවුලේ අය අතර සම්බන්ධතාවයන් වලදී

ඔබගේ නෑදැයින් සහ මිතුරන් අතර සම්බන්ධතාවයන් වලදී

අන්යයන් සමග ඔබගේ සම්බන්ධතාවයන් වලදී

සියලු කාලයේදීම ඔබ අතින් කරනු ලැබූ සියලු වැරදි උන්වහන්සේ වෙත ගෙනඑමින් උන්වහන්සේගේ කමාව ඉල්ලා සිටින්න )))

ස්වාමීන්වහන්ස ., මාගේ හදවත තුළ සැරිසරන්නාවූ සියලුම පාප මම දැනගන්නේ කොහොමද? තමන්ගේම වැරදි සොයා දැනගත හැක්කේ කාටද? මාගේ සැඟවුනු පාප වලට කරුණාකර මට සමා වන්න. මේ සැඟවුණු වැරදි වලින් මා පවිත්‍රකරන්න. උවමනාවෙන්ම කරන පව්වලින් මා ඈත්කර තබන්න. ඒවාට මා පාලනය කිරීමට ඉඩදෙන්න එපා සමිඳුනි. එවිට මම වරදකාරී හැඟීමෙන් නිදහස් වන්නෙමි· විශාල පාපවලින් නිවැරදිකරු වන්නෙමි.

මම පව්කර ඇත්තෙමි., මාගේ පාප සේදී යන්නේ ඔබවහන්සේගේ කරුණා අනුග්‍රහය නිසාය. එසේ වන්නේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මාගේ ගැළවුම්කරුවාණෝ බව මම පිළිගන්නා නිසාය. උන්වහන්සේ මෙලොවට පැමිණියේ මාගේ පාපය සහ මාගේ රෝගය නැතිකර දැමීමටය. උන්වහන්සේගේ කරුණා අනුග්‍රහයන් සහ අප උදෙසා කුරුසිය මත මරණය තුළින්., මට ඔබවහන්සේට මාගේ පියාණෙනි යන ලෙසින් කථාකිරීමට පුළුවන.

ස්වාමීන්වහන්ස., ඔබ ඉතා බලසම්පන්නය., එසේම ඉතාම ප්‍රේමණීයය. ඔවුන්., ඔවුන්ගේ පාප ගැන පසුතැවිලි වූ කල ., ඔබවහන්සේ නිනවය නගරයට මිදීම දෙමින් ., එහි සිටි සියලු දෙනා ගළවාගත් සේක. සවාමීන්වහන්ස., ඔබ කරුණාබර දයාවන්ත දෙවියන්වහන්සේය., කෝප වීමට ප්‍රමාදය., ප්‍රේමණීය කරුණා ගුණයෙන් පිරී ඇත .

කරුණාකර මා පවිත්‍රකරමින් මාගේ හදවත සහ මාගේ මනස පිරිසිදු කළ මැනව. මා විසින් කර ඇති පාපවලට මට කමාව දුන මැනව. යේසුස්වහන්සේගේ ශුද්ධ ලෙයින් මා සෝදා පවිත්‍රකළ මැනව. ඔබවහන්සේගේ ශුද්ධවූ සහ බලසම්පන්නවූ නාමයට මම ස්තුතිය සහ ප්‍රශංසාව දෙන්නෙමි.

මාගේ මුඛයේ වචනද මාගේ හදවතේ භාවනාද ඔබවහන්සේ ඉදිරියේ පිළිගැනීමට සුදුසු වේවා. අනේ සමිඳුනි., ඔබ මාගේ ශක්තියයි., ඔබ මාගේ ගැළවුම්කරුවාණෝයි. කරුණාකර මට සමාව දෙමින්., ඔබගේ සමාදානයෙන් ප්‍රේමයන් සහ ප්‍රීතියන් මට ආශිර්වාද කළ මැනව. මගේ පවුලටද කරුණාකර ආශිර්වාද කළ මැනව.

පියාණෙනි., යේසුස්වහන්සේගේ බලවත්වූ සහ ශුද්ධවූ නාමයෙන් යාච්ඤාකරමි., ආමෙන්.

බයිබල් සඳහන (ගිතාවලිය 19:12-14)

අන්යියන්ට කමාවදීමට හැකිවීම ලැබීම උදෙසා යාච්ඤාව

ප්‍රේමණීය ස්වර්ගීය පියාණෙනි., මාගේ සිත රිදී ඇත . මට කමාවදිය නොහැකි යැයි ලෙස හැඟීමක් ඇතිවේ. ((( ඔබට කමාවදීමට අමාරු පුද්ගලයාගේ නම සඳහන් කරන්න ))) මේ සිද්ධියට සමාවදීමට මට අමාරුයි. එනමුත්., සමිඳුනි., මාගේ හදවත තුළ කමාව නොදීමේ ගුණාංගය ඇතුලත්ව තිබීම ඔබට අවශ්‍යනැති බව මම දන්නෙමි. මට ඔබවහන්සේගෙන් ඉගෙනගැනීමට බොහෝ දේ තිබෙන්නේය. ඔබවහන්සේගේ ඒකජාතක පුත්‍රයාණන් වූ අප ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මේ ලෝකයට එවුවේ., මා වෙනුවෙන් කුරුසිය මත මරණයට පත්වෙමින්., මාගේ පාප සහ රෝග මාගෙන් අහෝසි කිරීමටය. උන්වහන්සේගේ අනගි ලේ තුළින් මාගේ පාප වලට කමාව ලැබී., ඒවා සදහටම සෝදා පවිත්‍රකරනු ලැබුවේය. තවද පියාණෙනි., මාගේ පසුගිය පාප ඔබ කිසිදා මතක් නොකරන බව ඔබ පවසා තිබෙන්නේය.

සමිඳුනි., අන්‍යයන් වෙත කරුණාවෙන් අනුකම්පාවෙන් සිටීමට මට ඉගැන්වුව මැනව. අපගේ ස්වාමීවූ යේසුස්වහන්සේ තුළින් ඔබවහන්සේ මට කමාව දුන් ලෙසම අන්‍යයන්ට කමාවදීමට මට ඉගැන්නුව මැනව. පියාණෙනි., මම යාච්ඤා කරන්නේ යේසුස්වහන්සේගේ බලවත් නාමයෙන්ය. ආමෙන්.

බයිබල් සඳහන (එපීස 4:32., හෙබ්‍රෙව් 10:17)

බිය යටපත්කර ජයගැනීමට යාච්ඤාව

ප්‍රේමණීය ස්වර්ගීය පියාණෙනි., ඔබගේ ශුද්ධ නාමය බලවත් පවුරක්ය. මම ඔබ වෙත දුව එමි., එවිට මම සුරක්ෂිත වෙමි. ඔබ මාගේ ස්වාමීන්වහන්සේය., මාගේ දෙවියන්වහන්සේය. ඔබවහන්සේ එම්මානුවෙල් වන්නේය., දෙවියන්වහන්සේ අප සමඟ. මා තුල සිටින තැනන්වහන්සේ ලෝකයේ සිටින තැනන්වහන්සේට වඩා උතුම්ය. මම බිය නොවන්නෙමි.

ස්වාමීනි., මම ඔබවහන්සේගේ දරුවා වන්නෙමි., මා මගපෙන්වනු ලබන්නේ ශුද්ධාත්මයාණන් විසින්ය. මම ඔබගේ දරුවා යයි ස්ථිරව පැවසීමට ශුද්ධාත්මයාණෝ මාගේ ආත්මය සමඟ එකතුවන සේක.

ස්වාමීනි., ඔබවහන්සේ සියල්ල භාරව සිටින සේක., සියල්ල පාලනය කරන සේක. ඔබ මාගේ අබ්බා පියාණෝ බැවින් මට බිය වීමට කිසිම දෙයක් නැත .

ස්තුතිවේවා පියවූ සමිඳුනි., ඔබවහන්සේගේ සමාදානයෙන් මට දිගටම ආශිර්වාද කළමැනව. තවද පියාණෙනි., බිය අභිබවා ජයගැනීමට අවශ්‍යයි වන්නාවූ අන්‍යයන් උදෙසාද ඔබවහන්සේගේ දයාව සහ අනුග්‍රහය ඉල්ලා මම යදිමි. පියාණෙනි., මම යාච්ඤාකරන්නේ යේසුස්වහන්සේගේ බලවත්වූ නාමයෙන්ය. ආමෙන්.

බයිබල් සදහන (හිතෝපදේශ 18:10., 1 යොහන් 4:4., රෝම 8:14-16)

දෙවියන්වහන්සේ තුළ ඇදහිල්ල සහ බලාපොරොත්තුව උදෙසා යාච්ඤාව

ස්වාමීනි., මාගේ යාච්ඤා අදහස් සමග ඔම ඔබ වෙත එන්නෙමි. මාගේ යාච්ඤා ඔබවහන්සේ අසන බව මම දන්නෙමි. මම දුර්වලව., මගේ සිත තුළ සැකයන් ඇතිවන අවස්ථා තිබෙන්නේය. මාගේ ඇදහිල්ල දුර්වලවන්නාවූ අවස්ථා ඇත්තේය. මාගේ ඇදහිල්ල දුර්වල වන්නාවූ අවස්ථාවන් ගැන කමාවුව මැනව. කරුණාවෙන් මාගේ විශ්වාස මදකම ගැන කමාවුව මැනව.

ඇදහිල්ල පැමිණෙනුයේ දෙවියන්වහන්සේගේ වචනය ඇසීමෙන්ය. ඔබවහන්සේගේ ශුද්ධ වචනය වන බයිබලය කියවීමෙන් මම තව වැඩිපුර වෙලාව ගතකරන ලෙස කරුණාවෙන් මට ආශිර්වාද කරන්න. කරුණාවෙන් මාගේ ඇදහිල්ල වැඩි කළ මැනව. අප බලාපොරොත්තු වන දෙය ඇත්තටම ලැබෙන බවට අපට ඇති සහතිකය ඇදහිලල වන්නේය. එමගින් අපට දැකිය නොහැකි දෙය ගැන සහතිකයක් ලබාදෙන්නේය. ඔබවහන්සේ තුළ මාගේ ඇදහිල්ල වැඩිවන ලෙස මට ආශිර්වාද කළ මැනව.

ඔබවහන්සේ අපගේ යාච්ඤා වලට පිළිතුරු දෙන අපගේ ප්‍රේමණීය දෙවියන් වහන්සේ බව මම දන්නෙමි. මා යාච්ඤා කරන දෙය මට යහපත් නොවන අවස්ථා ඇති නම් මා වෙත වූ යහපත්ම දෙයින් මට ආශිර්වාද කළ මැනව. ශුද්ධවූ සමිදුනි ඔබවහන්සේට මා සහ මගේ ජීවිතයට ඇති උතුම්ම සැලසුම් ඇති බවට ඔබ පොරොන්දුවී එනම් සමාදානයේ සැලසම් මට යහපත් අනාගතයක් දීමට සහ බලාපොරොත්තුවක් දීමට සැලසුම් මා වෙත තිබිය හැකි යහපත්ම සැලැස්ම බව මම විශ්වාස කරමි. ඔබවහන්සේට කීකරුවීමට මට ඉගැන්නුව මැනව.

ඔබවහන්සේ බලාපොරොත්තුවේ දෙවියන්වහන්සේය. මම ඔබ විශ්වාස කරන බැවින් මාගේ ජීවිතය සම්පූර්ණයෙන්ම ප්‍රීතියෙන් සහ සමාදානයෙන් ඔබවහන්සේ පුරවාලනු ඇතැයි මම යාච්ඤා කරමි. එවිට ශුද්ධාත්ම බලය තුළින්. ස්ථිරකමෙන් සහ බලාපොරොත්තුවෙන් මම පිරී ඉතිරී යන්නෙමි.

තමන්ගේ ඇදහිල්ල සමග පොරබදිමින් සිටින අන්යියන් ගැනද මම යාච්ඤා කරමි. ඔවුන් ඔබවහන්සේ තුළවූ එම බලාපොරොත්තුවේ ආලෝකය අත්දැකීමට අවශ්‍යම ඇත්තේය.

පියාණෙනි යේසුස්වහන්සේගේ නාමයෙන් මම යාච්ඤා කරමි. ආමෙන්.

බයිබල් සඳහන (රෝම 10:17 යෙරමියා 29:11 රෝම 15:13 හෙබ්‍රෙව් 11:1)

ප්‍රේමය උදෙසා යාච්ඤාව - යේසුස්වහන්සේගේ ප්‍රේමය තුළින් නපුර ජයගැනීම

ප්‍රේමණීය ස්වර්ගීය පියාණෙනි අපගේ පවුල් වලට නපුර කිරීමට උත්සාහකළ අය අපට දැනුවත් හෝ නොදැනුවත්ව අපට හානිකිරීමට වීරියකල අය දැන් අපි යාච්ඤාවෙන් ඔබ වෙතට ගෙනෙමුව. පියාණෙනි අන්‍යයන්ට කමාවන ලෙස ඔබ අපට උපදෙස් දී ඇත . එහෙයින් මේ අයගෙන් සියලුදෙනාටම අපි දැන් කමාව දෙන්නෙමු. තවද මේ අයට සමාදානය සහ සඵලත්වය දෙන ලෙස අපි යාච්ඤා කරමු. ඔබවහන්සේගේ කරුණා අනුග්‍රහය සමාදානය සහ සඵලත්වය දෙන ලෙස අපි යාච්ඤා කරමු. ඔබවහන්සේගේ කරුණා අනුග්‍රහය සමාදානය සහ දයාවෙන් ඔවුන්ට ආශිර්වාද කළ මැනව.

ස්වාමීවූ යේසුස්වහන්ස ඔබ මෙසේ පැවසූසේක - නුඹලාගේ සතුරන්ට ප්‍රේමකරන්න ඔබට ශාපකරන අයට ආශිර්වාද කරන්න ඔබට ද්වේශකරන අයට යහපත කරන්න ඔබට හිරිහැර කරමින් පීඩාකරන අය උදෙසා යාච්ඤාකරන්න. එවිට නුඹලා ස්වර්ගයේ සිටින නුඹලාගේ පියාණන්ගේ පුත්‍රයෝ වන්නෝය. මන්ද උන්වහන්සේ නපුරු අයටත් යහපත් අයටත් තමන් ඉර උදාකරවන සේක. ධර්මිෂ්ඨ සහ අධර්මිෂ්ඨ සියලුදෙනාට වැසි එවන සේක.

බයිබල් සඳහන (මතෙව් 5:44-45)

යටත්වීම උදෙසා යාච්ඤාව - මාගේ ජීවිතය දෙවියන්වහන්සේට භාරදීම

ස්වාමීනි “ඉල්ලන්න එවිට ඔබට දෙනු ලැබේ· සොයන්න එවිට නුඹලාට සම්බවේ· තට්ටුකරන්න එවිට නුඹලාට දොර හරිනු ලැබේ” යයි ඔබවහන්සේ පැවසූ සේක. ස්වාමීනි මෙන්න මම මෙහිය. මාගේ ජීවිතයට එන ලෙස මම ඉල්ලාසිටිමි. සමිඳුනි ඔබගේ කැමැත්ත මම සොයමි මාගේ ජීවිතය ඔබවහන්සේට යටත්කරමි. සමිඳුනි මාගේ ජීවිතයේ පළමු ස්ථානය ඔබට දෙන්නෙමි. කරුණාකර එය පාලනය කරන්න සමිඳුනි. මන්ද ඔබවහන්සේගේ සැලැස්ම මගේ ජීවිතය සඳහාවූ යහපත්ම සැලැස්ම බව මම දනිමි.

ඔබවහන්සේ අපගේ යැදුම්වලට පිළිතුරු දෙන අපගේ ප්‍රේමණීය දෙවියන්වහන්සේ බව මම දනිමි. මම මා උදෙසා කරන යැදුම මට සුදුසු නොවන්නේ නම් එය මට යහපත්ම එක නොවේ නම් මට යහපත්ම දෙයින් මට කරුණාවෙන් ආශිර්වාද කළ මැනව. ශුද්ධ සමිඳුනි මට සහ මාගේ ජීවිතයට සමාදානයෙන් සැලසුම් මට දීප්තිමත් අනාගතයක් සහ බලාපොරොත්තුවක් ගෙනදීමේ සැලසුම් වැනි අති උතුම් සැලැස්මක් ඇති බව ඔබවහන්සේ පොරොන්දු වූ සේක. මා උදෙසා ඔබවහන්සේ සාදා ඇති සැලසුම් මාගේ ජීවිතයට තිබිය හැකි යහපත්ම සැලසුම බව මම විශ්වාසකරමි. අහස පොළවට උස්ව තිබෙන්නාක් මෙන් ඔබවහන්සේගේ සිතුවිලි සහ ඔබවහන්සේගේ සැලසුම් මගේ සිතුවිලි සහ සැලසුම් වලට වඩා උසස්ය. ඔබවහන්සේට කීකරුවීමට මට ඉගැන්නුව මැනව. ඔබගේ වචනය ලෙස මට සිදු වේවා

ස්වාමීනි ඔබවහන්සේගේ මාර්ග ඔට ඉගැන්නුව මැනව. එවිට මම ඔබගේ සත්‍යයට අනුව ජීවත් වන්නෙමි. “මම ඔබවහන්සේට ගෞරවය දීම සදහා මාගේ හදවතේ පවිත්‍රිතාඹ්ට දුන මැනව.

පියාණෙනි යේසුස් වහන්සේගේ බලවත් නාමයෙන් මම යාච්ඤාකරමි. ආමෙන්.

බයිබල් සඳහන (මතෙව් 7:7 ගීතාවලිය 86:11 යෙරමියා 29:11 ලූක් 1:38 යෙසායා 55:9)